# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
## 2005 / 2006

LANKA SATHOSA

GRACEFULLY FORWARD

## සීමාසහිත ලංකා සතොස

# වාර්ෂික වාර්තාව
# 2005 / 2006

ලංකා සතොස

අභිමානයෙන් ඉදිරියට

## පටුන


| | | | |
|---|---|---|---|
| 01. | අමාත්‍යතුමාගේ පණිවුඩය | - | 5 |
| 02. | සභාපතිතුමාගේ සමාලෝචනය | - | 7 |
| 03. | මානව සම්පත් හා පරිපාලන අධ්‍යක්ෂතුමාගේ වාර්තාව හා සේවක සංඛ්‍යාව | - | 11 |
| 04. | මෙහෙයුම් අධ්‍යක්ෂතුමාගේ වාර්තාව | - | 15 |
| 05. | මූල්‍ය කණ්ඩායමේ වාර්තාව (2005 / 2006 වාර්ෂික ගිණුම්) | - | 19 |
| 06. | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්තුමියගේ පණිවුඩය | - | 39 |




ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට



# ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

සීමාසහිත ලංකා සතොස සමාගමේ පළමු වාර්ෂික මහ සභා රැස්වීම වෙනුවෙන් මාගේ හෘද්‍යංගම සුභ පැතුම් එක් කරන්නේ අතිමහත් සතුටිනි.

සීමාසහිත ලංකා සතොස සමාගම ආරම්භ කරනු ලැබුවේ පාරිභෝගික ජනතාවට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සාධාරණ මිලට ලබාදෙමින් ඉහළ යන ජීවන වියදම් බර සැහැල්ලු කිරීමට දූරදර්ශී දේශපාලන තීරණය මතයි.

සීමාසහිත ලංකා සතොස සිල්ලර අලෙවි ජාලය නවතා දැමීමෙන් පසු රැකියා අහිමි වූ සේවකයින් සීමාසහිත ලංකා සතොස සමාගම සේවක සංඛ්‍යාවට අනුයුක්ත කරනු ලැබුවේ සීමාසහිත ලංකා සතොස සමාගම ආරම්භ කිරීමේ මූලික අභිමතාර්තයක් සපුරාලමිනි. තව දුරටත් එමඟින් දිවයින පුරා සිල්ලර අලෙවි ශාඛා ආරම්භ කරමින් ජනතාවට දැරිය හැකි මිළකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීමට පියවර ගෙන තිබේ. එබැවින් එය පාරිභෝගික ජනතාවගේ විශ්වාසය දිනාගෙන ඇති අතර, එය කෙටි කාලයක් තුළ සීමාසහිත ලංකා සතොස ආයතනය ශක්තිමත්ව වර්ධනය වීමට උපකාරී වී තිබේ. සීමාසහිත ලංකා සතොස සමාගම සිය සේවා පෞද්ගලික අංශයේ වෙනත් සුපිරි වෙළෙඳ සංකීර්ණ මෙන් නාගරික ජනතාවට පමණක් සීමා නොවී ඈත ගම්දනව් ජනතාවටද සේවා සැපයීමට සමත් වී තිබේ. කිරිපිටි මිළ ඉහළ යාමේ දැවෙන ප්‍රශ්නයට පිළිතුරු සපයමින් සීමාසහිත ලංකා සතොස සමාගම "ලක් සතොස" හා "කැන්ඩි මිල්ක් පවුඩර්" කිරි පිටි නිෂ්පාදන සන්නාම දෙකක් වෙළෙඳපොළ හඳුන්වා දී තිබේ. එමඟින් පෞද්ගලික අංශයේ කිරි පිටි සැපයුම් කරුවන්ට සිය මිළ නියමකිරීමේ උපාය මාර්ග ගැන යළි සලකා බැලීමට සිදුවී ඇත.

මෙම සමාගම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත බිහි වූවකි. සමාගමේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වඩා යහපත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා වන "මහින්ද චින්තන" ප්‍රතිපත්ති යථාර්තයක් බවට පත්කිරීමට ගන්නා නොමඳ උත්සහය හා කැපවීම වෙනුවෙන් මගේ හද පිරි ස්තූතිය පිරිනමමි. ඔවුන්ගේ ඉදිරි ක්‍රියාමාර්ග සාර්ථක වේවායි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

**බන්දුල ගුණවර්ධන**
අමාත්‍ය - වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර සහ පාරිභෝගික සේවා
කොළඹ.

2008 ජූනි 23



# සභාපතිතුමාගේ පණිවුඩය

සීමාසහිත ලංකා සතොස සමාගමේ 2005 / 2006 ප්‍රථම වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වෙන මෙම විශේෂ අවස්ථාවේ එහි කාර්ය සාධන සමාලෝචන පිළිබඳ සමාගමේ සභාපතිවරයා ලෙස මෙම පණිවිඩය නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍ය හා වරප්‍රසාදයක් ලෙස සලකමි.

සීමාසහිත ලංකා සතොස සමාගම 2005 ඔක්තෝම්බර් මාසයේදී සංස්ථාපිත කරනු ලැබුවේ පාරිභෝගික ජනතාවට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා වෙනත් සියළු භාණ්ඩ සාධාරණ හා දැරිය හැකි මිළට අලෙවි කිරීමේ හා බෙදාහැරීමේ පරම අපේක්ෂාවෙනි. එහි සිල්ලර අලෙවි ශාඛා මඟින් ජනතාවගේ ජීවන බර අඩු කිරීමට විශාල කාර්යභාරයක් ඉටු කර ඇති අතර, රජයට දැඩි මූල්‍ය හා දේශපාලන ගැටළුවක් බවට පත්ව තිබූ සතොස සිල්ලර අලෙවි සමාගමේ සේවකයින්ගේ රැකියා සුරක්ෂිත කිරීමට ද හැකි වී තිබේ. "මහින්ද චින්තන" ප්‍රතිපත්ති මඟින් ප්‍රතිඥා දී ඇති පරිදි දිවයිනේ සෑම ගමකම සතොස ආහාර අලෙවි ශාඛාවක් හෝ සමූපකාර අලෙවි සැලක් ස්ථාපිත කිරීමේ මහඟු කාර්යභාරය ද එමඟින් ඉටුකර තිබේ. ශ්‍රී ලංකාවේ විශාලතම සිල්ලර අලෙවි ජාලය බවට පත්වීමේ ඉලක්කය සක්ෂාත් කර ගැනීමට සීමාසහිත ලංකා සතොස සමාගම ක්‍රියාකරන අතර, ජනතාවගේ ජීවිත සෞභාග්‍යමත් කිරීම සඳහා ජීවන වියදම අවම කිරීමට රජය යටතේ ඇති වඩාත් ශක්තිමත් හා කාර්යක්ෂම යන්ත්‍රණය බවට පත්වීමට අපේක්ෂිතයි.

පළමු ලංකා සතොස ශාඛාව 2005 දෙසැම්බර් මාසයේ දී මීගමුවේ දී විවෘත කෙරුණු අතර, 2006 මාර්තු 31 වෙනිදායින් අවසන් වූ මුදල් වර්ෂය තුළ තවත් ශාඛා 08 ආරම්භ කරමින් සම්පූර්ණ ශාඛා ජාලය 09 ක් බවට පත් වී ඇත.

මෙම සමාලෝචන කාලසීමාව තුළ රුපියල් මිලියන 30.8 ක පිරිවැටුමක් වාර්තා කිරීමට සමත් වූ අතර, එය සාමාන්‍ය මට්ටමට වඩා අඩු ප්‍රමාණයකි. එහෙත් ඉන් පසුව ඇති වූ ප්‍රගතිය අනුව එම මට්ටම දැන් ඉක්මවා ගොස් තිබේ. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව සමඟ සැපයුම්කරුවන් ඇති කරගෙන තිබූ අයහපත් අත්දැකීම් හේතුවෙන් ලංකා සතොස සමාගමට භාණ්ඩ ලබාගැනීමේ දී විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට සිදු විය. ඇතැම් භාණ්ඩ වර්ග සපයා ගැනීමට නොහැකි වූ නිසා මුළු පිරිවැටුම අඩුවීමට ද හේතු විය. විවිධ අංශවල ප්‍රධානීන් ලබා දී ඇති වාර්තා, විශේෂයෙන් මුදල් අංශයේ ප්‍රකාශ හා ප්‍රස්ථාර සටහන් මඟින් තහවුරු වන පරිදි නුදුරු අනාගතයේම අප ආයතනය ඉහළ දියුණුවක් ලබන බව මම අවධාරණය කරමි. 2007 කැලන්ඩර් වර්ෂය සිට මේ දක්වා වාර්තා මඟින් පැහැදිලි ප්‍රගතියක් පෙන්නුම් කරයි.

රජයට අයත් ආයතනයක් ලෙස එල්ලවන සියළු අභියෝග වලට මුහුණ දෙමින් එහි සේවකයින්ගේ දැඩි කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විට අප ශාඛා සංඛ්‍යාව 80 ක් බවට පත් වී ඇත.

අපගේ මෙහෙවර අඩුම මිළට තත්ත්වයෙන් උසස් භාණ්ඩ පාරිභෝගික ජනතාවට සපයන රටේ තරඟකාරී සිල්ලර අලෙවි ආයතනයක් නිර්මාණය කිරීමයි. ස්වයං පාලන මහජන සමාගමක් ලෙස සීමාසහිත ලංකා සතොස මෙම වාර්තාවේ කාර්ය මණ්ඩලය විසින් දක්වා ඇති කාර්ය සාධනය අත්පත් කරගනිමින් නිසැකවම දියුණුවට පත් ව බව මම විශ්වාස කරමි.

එබැවින් සීමාසහිත ලංකා සතොස සමාගමේ අනාගතය එය කාර්ය සාධන වාර්තා අනුව ඉතා දීප්තිමත් වන බව මගේ අපේක්ෂාවයි.

**නලින් ප්‍රනාන්දු**
සභාපති

2008 මැයි 24



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# සීමාසහිත ලංකා සතොස සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය



පසුපෙළ සිටගෙන :- එරල් එම්. ඒ. වීරසිංහ මයා, ඩී. විදානගමාච්චි මයා, ඒ. පී. ජී. කිත්සිරි මයා
ඉදිරිපෙළ අසුන්ගෙන (වමේ සිට) :- ඩී. එස්. සී. ටී. රොෂානි ඩී. රත්නායක මිය, නලින් ආර්. ප්‍රනාන්දු (සභාපති), ආචාර්ය ආර්. එම්. කේ. රත්නානයක මයා සහ සජිත් රුචික ආර්ටිගල මයා

# සීමාසහිත ලංකා සතොස සමාගමේ

## වාර්ෂික මහ සභා රැස්වීම සඳහා මානව සම්පත් අංශයේ සමාලෝචනය

### අතීතය

සීමාසහිත ලංකා සතොස සමාගම 2005 වසරේ දෙසැම්බර් අගභාගයේ දී එහි මෙහෙයුම් ආරම්භ කලේ මීගමුවේ ප්‍රථම අලෙවි ශාඛාවේ සේවකයින් 27 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සමඟිනි. එදා සිට සමාගම තවත් අලෙවි ශාඛා ආරම්භ කරමින් එහි අලෙවි කටයුතුවල ස්ථාවර වර්ධනයක් ඇති කළේය. එහි මූලික අවදියේ කාර්ය මණ්ඩලය වූයේ සතොස සිල්ලර සමාගම වසාදමන අවදියේ එමගින් ඉදිරිපත් කළ ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ ක්‍රමයට අකැමැති වූ සේවක පිරිසයි. ඒ අනුව අප සේවකයින් අනුයුක්ත කළේ ඒ ඒ අංශවල අවශ්‍යතා සලකා බලමින් අවශ්‍ය කළ තත්ත්වය සේවක සංඛ්‍යාව අනුවයි. ඒ අනුව සෑම ලාභ ලබන මධ්‍යස්ථානයක්ම මෙහෙය විය හැකි පරිදි අවම කාර්ය මණ්ඩලයක් මනා පාලනයකින් යුක්තව යෙදවීමට අපට හැකි විය. අපගේ සිල්ලර අලෙවි ශාඛාවල සේවක අතිරික්තයක් ඇති වීමට කිසිසේත් ඉඩ නොතබන ලදි.

අපගේ සේවක සංඛ්‍යාවේ හොඳම සේවකයින් රඳවා තබාගනිමින් වුන කාර්ය සාධනයක් ඇති සේවකයින් ඉවත් කළ හැකි ආකාරයේ විස්තීරණ කාර්ය සාධන ඇගයුම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අපට හැකි විය. කාර්ය සාධන ඇගයුම් ක්‍රියාවලියේ අවධාරණය යොමු කෙරුණේ මුල් මාස 03 ක මූලික කාල සීමාවටත් ඉන් පසු මාස 06 ක පරිවාස කාල සීමවටයි. ඇගයුම් ක්‍රියාවලියේ මේ සියළු අදියර තුළින් සේවකයින්ගේ අඩුපාඩුකම් හා දුර්වලතා හඳුනාගෙන ඔවුන් සමඟ සාකච්ඡා කරමින් ඒවා නිවැරදි කරගැනීමට අපට අවස්ථාව උදා විය.

අපේ මෙහෙයුම් වල පළමු වර්ෂය තුළ අලෙවි සැල් 47 ක් විවෘත කිරීමටත්, සම්පූර්ණ සේවක සංඛ්‍යාව 453 දක්වා වැඩි කර ගැනීමට හැකි විය. 2006 ජූනි 12 වන දා වන විට හලාවත සහ මොරටුව ප්‍රදේශ ආවර්ණය කරමින් සිල්ලර අලෙවි ශාඛා 10 ක් විවෘත කිරීමට අප හැකි විය.

වසර 2007 දී සිල්ලර අලෙවි සැල් 68 ක් සහ සේවක සංඛ්‍යාව 605 ක් දක්වා වැඩිකර ගැනීමට අවස්ථාව උදාවුනි. අපගේ මෙහෙයුම්වල දෙවැනි වසර තුළ අප සේවක සංඛ්‍යාව දිනෙන් දින පුළුල් වන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් අළුතින් සේවකයින් බඳවා ගැනීමට සිදු විය. කෙසේ වෙතත් සමාගමේම එක් ඒකකයට සේවකයින් 09 ත් 10 ත් අතර ප්‍රමාණයක් වන පරිදි සේවක සංඛ්‍යාව නඩත්තු කිරීමට ද අපි වග බලාගතිමු. අලෙවිය මුල සිට ආරම්භ කරන ආයතනයක් ලෙස එවැනි සුළු සේවක ප්‍රමාණයකින් පවත්වාගෙන යාමට හැකි වීම ව්‍යාපාරික වශයෙන් සෞඛ්‍ය සම්පන්න විය.

### වර්තමානය

2008 මාර්තු අවසානය වන විට අලෙවි සැල් 74 ක් විවෘත කිරීමට හැකියාව ලැබුණි. දැනට අපි අලෙවිසැල් 80 විවෘත කොට ඇති අතර, එහි සමස්ථ සේවක සංඛ්‍යාව 716 කි. අපි මේ වන විට වීරවිල හා රත්නපුර බෙදා හැරීම් මධ්‍යස්ථාන පවත්වා ගනිමින් කොළඹ ප්‍රදේශයේ තොග ගබඩා මධ්‍යස්ථාන 02 ක් මෙහෙයුම් කරමින් සිටිමු.

විශේෂයෙන් නායකයින් ඇතුළු කාර්ය මණ්ඩලය ආවර්ණය වන පරිදි සේවක පුහුණු වැඩසටහනක් ද ආරම්භ කර තිබේ. එම වැඩසටහන මඟින් සාමූහික ක්‍රියාවලිය, ආකල්ප සංවර්ධනය, අලෙවි නිපුනතා ආදී විෂයක්ෂේත්‍ර පුහුණු කෙරේ. බොහෝමයක් සේවස්ත පුහුණු වැඩසටහන්, ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අපගේ මුදල්, මෙහෙයුම්, ප්‍රසම්පාදන සහ මානව සම්පත් ඒකක කළමණාකරුවන්ට හැකි වී ඇත. මෙම පුහුණු සැසි වලදී අපේ විශේෂ අවධානය යොමු වන්නේ කාර්ය මණ්ඩලය තුළ විනය පවත්වාගැනීම හා වෙනත් මෙහෙයුම් උපාය මාර්ග වැඩිදියුණු කර ගැනීමටයි. මෙම වැඩසටහන් මඟින් ආයතනයට විවිධ ප්‍රතිලාභ ලැබෙන අතර, අපගේ සේවකයින්ගේ ආකල්ප වර්ධනය කිරීමට හැකි වී ඇත. එහෙත් අප විශ්වාස කරන්නේ අඛණ්ඩ පුහුණු වීම් මඟින් ඉදිරියේදී තවත් සාර්ථකව මෙහෙයුම් සිදු කිරීමට හැකි වන බවයි.

### අනාගතය

අප සමාගමේ මානව සම්පත් සාධකය අපගේ අනාගත කාර්ය සාධනයට ස්ථිරවම හේතු වන බැවින්, ආයතනයට මෙන්ම සේවකයින්ට ද ප්‍රතිලාභ ලැබෙන විවිධ උපාය මාර්ග ආරම්භ කර තිබේ. ඉන් එක අනාගත සැළැස්මක් නම් සේවක සුභසාධන අරමුදලක් ඇති කිරීමයි. එමගින් සේවකයින්ට සහන සැලසෙනු ඇත. තවදුරටත් 2008 වසරේ ජනවාරි මුල වන විට සියළුම මට්ටම් වල සහ කාණ්ඩවල සේවකයින්ට ප්‍රතිලාභ ලැබෙන පරිදි වාර්ෂික සේවක සුහද හමුවක් ද ආරම්භ කෙරුණි. මෙය ඉතාම සාර්ථක අවස්ථාවක් වූ අතර, සේවයින් අතරේ සුහද සම්බන්ධතා මෙන්ම කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීමට හේතු විය. තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් තබාගැනීමෙන් නිසැකවම ලංකා සතොස ආයතනයේ ව්‍යාපාරික කටයුතු හා එහි අනාගතය සාර්ථක වන බව අපගේ විශ්වාසයයි.

**ප්‍රියාල් පෙරේරා**

අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිපාලන

2008 ජූනි 24

ලංකා සතොස

අභිමානයෙන් ඉදිරියට

ඇමුණුම

## වර්තමානයේ ඇති හා ඉදිරියේදී ඇතිකෙරෙන තනතුරු

| තනතුරු කාණ්ඩ | | තනතුරු සංඛ්‍යාව | පවත්නා මුළු කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| 01 | සාමාන්‍යාධිකාරී | | 03 |
| 02 | අධ්‍යක්ෂවරු | | 03 |
| | මුදල් කළමනාකරු | 01 | |
| | අධ්‍යක්ෂ මෙහෙයුම් | 01 | |
| | අධ්‍යක්ෂ මානව සම්පත් හා පරිපාලන | 01 | |
| 03 | ජ්‍යේෂ්ඨ කළමනාකරු | | 03 |
| | ඉන්ජිනේරු කළමනාකරු | 01 | |
| | වාණිජ්‍ය කළමනාකරු | 01 | |
| | මෙහෙයුම් කළමනාකරු | | |
| 04 | මධ්‍යමට්ටමේ කළමනාකරුවන් | | 03 |
| | ප්‍රසම්පාදන කළමනාකරු | 01 | |
| | ගණකාධිකාරී | 01 | |
| | තොග ගබඩා මෙහෙයුම් කළමනාකරු | 01 | |
| | මානව සම්පත් හා පරිපාලන කළමනාකරු | | |
| | අභ්‍යන්තර විගණක | | |
| 05 | කණිෂ්ඨ කළමනාකරුවන් | | 09 |
| | අභ්‍යන්තර විගනක කළමනාකරු | 01 | |
| | ක්‍ෂේත්‍ර කළමනාකරුවන් | 08 | |
| | ගබඩා කළමනාකරුවන් | | |
| 06 | ජ්‍යේෂ්ඨ විධායකයින් | | 11 |
| | සහකාර ගණකාධිකාරී | | |
| | සහකාර ප්‍රසම්පාදන කළමනාකරු | 01 | |
| | සහකාර කළමනාකරු මා. ස. හා පරි. | | |
| | අලෙවිසැල් කළමනාකරු | 06 | |
| | සහකාර අභ්‍යන්තර විගණක | 01 | |
| | කාර්මික නිලධාරී | | |
| | සහකාර තොග ගබඩා / ගබඩා කළමනාකරු | 03 | |
| 07 | කණිෂ්ඨ විධායකයින් | | 16 |
| | ගිණුම් නිලධාරී | 01 | |
| | විධායක මා. ස. හා පරි. | 03 | |
| | විගණන නිලධාරී | | |
| | පෞද්ගලික සහකාර - ලේකම් | 02 | |
| | සහකාර අලෙවිසැල් කළමනාකරු | 10 | |
| 08 | ලිපිකරු සහ ආශ්‍රිත ශ්‍රේණි | | 139 |
| | බහුකාර්ය සහකාරවරුන් | 51 | |
| | ගිණුම් සහකාර | 06 | |
| | විගණන සහකාර | 05 | |
| | ජ්‍යේෂ්ඨ අලෙවි සහකාර | 54 | |
| | අලෙවි අධ්‍යක්ෂ හෝ අලෙවි සහකාර | 23 | |
| 09 | අලෙවි / කාර්මික කාර්ය මණ්ඩලය | | 205 |
| | අලෙවි සහකාර | 203 | |
| | නඩත්තු සහකාර | 01 | |
| | ප්‍රදර්ශන / අලෙවි සහකාර | 01 | |
| 10 | ගබඩා හෝ සම ශ්‍රේණි | | 317 |
| | ගබඩා සහකාර | 282 | |
| | කාර්යාල සහකාර | 02 | |
| | රියදුරු | 01 | |
| | කම්කරු | 32 | |

**2008 මැයි 31 වන දිනට සේවයේ යෙදී සිටින මුළු සේවක සංඛ්‍යාව 705**

2008 ජූනි 16



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# වාර්තාකරනය මත පදනම් වූ ආයතනික සංවිධාන සටහන - ලංකා සතොස සමාගම




මානව සම්පත් හා පරිපාලන අංශය - *06, 05. 2008*

ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# 2005 / 2006 වාර්ෂික වාර්තාව

## මෙහෙයුම් අංශය

### අලෙවිසැල් - 2006

- 2006 වසර තුළ අප සිල්ලර අලෙවිසැල් 50 ක් විවෘත කර ඇත.
- මීගමුව සහ වෙන්නප්පුව ආලෙවිසැල් වෙනත් ස්ථානවලට ගෙනයාමට සිදු විය. සමූපාකර තොග වෙළෙඳ සංස්ථාව පැවති සමයේ භාවිතා කළ ගොඩනැගිලි ඒවායේ අයිතිකරුවන්ට ආපසු ගැනීමට අවශ්‍ය විය.
- දෙමටගොඩ, දෙහිවල සහ අම්බලන්තොට අලෙවි සැල් වසා දමන ලදි. අයිතිකරුවන්ට එම ගොඩනැගිලි ආපසු අවශ්‍ය විය. ඒ වෙනුවට විකල්ප ස්ථාන සොයා ගැනීමට නොහැකි විය.
- පාඩු ලබමින් පැවති නිසා පූගොඩ අලෙවි සැල වසාදමන ලදි.
- වේයන්ගොඩ සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන තුළ ශාඛා විවෘත කිරීමට අපගෙන් ඉල්ලීමක් කරන ලදි. එහෙත් එම ශාඛාවලින් ලාභ ලැබීමට අපහසු වීම නිසා එම ශාඛා 02 වසා දැමීමට සිදු විය.
- වැලිසර බජට් ෂොප් සංකීර්ණයේ ද ශාඛාවක් ආරම්භ කිරීමට ඉල්ලීමක් කරන ලදි. ලාභ ලැබීමට අපහසු සහ තරඟකාරීත්වය හේතුවෙන් එම අලෙවිසැලද වසා දැමුණි.
- තොග අලෙවි සැලක් වීරවිල ආර්ථික මධ්‍යස්ථානයේ විවෘත කිරීමට ඉල්ලීමක් කෙරුණි. අපි දැන් එය බෙදාහැරීම් මධ්‍යස්ථානයක් ලෙසද පාවිච්චි කරමු.

### අලෙවිසැල් - 2007

- 2007 වසරේදී සිල්ලර අලෙවිසැල් 20 ක් විවෘත කොට ඇත.

### මිළ දී ගැනීම් සහ විකුණුම්

| කාල සීමව | ආහාර ද්‍රව්‍ය, සිල්ලර බඩු සහ මත්පැන් සමස්ත මිළ දී ගැනීම | මුළු විකුණුම් |
|---|---|---|
| 2006 වසර | මිලියන 651 | මිලියන 591 |
| 2007 වසර | මිලියන 2032 | මිලියන 2204 |

### බැංකු ආරක්ෂණ

- 2006 වසරේ දී බැංකු ආරක්ෂණ ප්‍රමාණය රුපියල් මිලියන 26,550,000 කි.
- 2007 වසරේ දී බැංකු ආරක්ෂණ ප්‍රමාණය රුපියල් මිලියන 28,550,000 දක්වා වැඩි කිරීමට හැකි විය.
- අප කෙරෙහි සැපයුම් කරුවන්ගේ විශ්වාසය වර්ධනය වූ අතර, බැංකු ආරක්ෂණ වටිනාකමට සමාන ණය පහසුකම් අපට තිබුණද ඊටත් වඩා වැඩි ණය ප්‍රමාණයක් සැපයුම්කරුවන් විසින් නිල නොවන ලෙස ලබාදෙන ලදි. අපගේ මුදල් ප්‍රවාහය බලාපොරොත්තු වූ පරිදි ඉටුනොවූ බැවින්, බොහෝ දින වල සැපයුම් කරුවන්ට කරන ගෙවීම් කල් දැමීමට සිදු විය. මේ නිසා අපගේ අලෙවිසැල් වලට ප්‍රධාන සිල්ලර බඩු සැපයීමේ බාධාවන්ට මුහුණ දීමටද අප හට සිදු වුණි.
- සැපයුම්කරුවන්ට කරන ගෙවීම් කල් දැමීමට සිදුවීම සහ ඒ නිසා අපගේ භාණ්ඩ සැපයුම් බාධා වීමෙන් අපගේ අලෙවිසැල් වල ප්‍රධාන සිල්ලර භාණ්ඩවල හිඟයක් ඇති විය. එබැවින් අපගේ මුදල් ප්‍රවාහය වර්ධනය කරගැනීමේ අවශ්‍යතාවක් මතු වුණි.

## මිළ අඩු භාණ්ඩ සැපයීම

- අත්‍යාවශ්‍ය භාණ්ඩ අලෙවියේදී ඉතා අඩු මිලට ඒවා විකිණීම නිසා ඇතැම් විශේෂිත භාණ්ඩ වල හිඟයක් ඇති වන බව අපට පෙනී ගියේය. උදාහරණයක් ලෙස කිරිපිටි (සුභසාධන) ඇසුරුම්. පාරිභෝගිකයින් අඩු මිළ භාණ්ඩ පමණක් මිළට ගැනීමට පැමිණීම හේතුවෙන් අපගේ කාර්ය මණ්ඩලයට විවිධ සීමා හා කොන්දේසි (නිල නොවන) පැනවීමට ද සිදුවිය. පාරිභෝගිකයින් අපගේ වෙළෙඳසැල් කරා පැමිණියේ අපගේ අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිල අඩු නම් පමණි. එබැවින් අප හට අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිළ හැකි අඩුම මට්ටමින් පවත්වා ගැනීමට සිදුවිය.

## ප්‍රවර්ධනය

- යුනිලිවර් සහ ෆොන්ටෙරා සමාගම් අපගේ අලෙවිසැල්වල බොහෝ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීමට ඉදිරිපත් විය. සීමා සහිත ඩේන්ජ් අලෙවි සමාගම පාරිභෝගිකයින් ආකර්ශනීය කර ගැනීම සඳහා අපගේ වෙළෙඳ තුළ ඩී.ජේ. සංගීතය සැපවූයේය. හේමාස් සමාගම, රෙකිට් බෙන්කීසර්, ලංකා කැනරීස්, වටවල තේ වැනි බොහෝ සැපයුම් කරුවන් ඔවුන්ගේ නිෂ්පාදන අඩු කල මිළට ලබාදෙමින් පාරිභෝගිකයින්ගේ ආකාර්ශනය වැඩි කර ගැනීමට උදව් කළේය. අපගේ අලෙවිසැල් තුළ අලෙවිය ප්‍රවර්ධනය කර ගැනීමට අපි සැපයුම් කරුවන්ගේ සහය ලබාගතිමු.
- යුනිලිවර්, ෆොන්ටෙරා, එලිෆන්ට් හවුස්, මැක්ෂීස් චිකන් ආදී සමාගම්වලින් අපට පරිත්‍යාග ලෙස බෝතල් සිසිලන යන්ත්‍ර, අධි ශීතකරණ, නාමපුවරු, මිළ දර්ශන ආදිය සැපයන ලදි. සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම ද අධි සීතරකරණ සැපයීමට ප්‍රතිඥා දුනි.

## අලෙවිය

- අපගේ අලෙවිසැල් වල නායකයින්ට පුහුණු සැසි සංවිධානය කරමින්, ඒවායේ අලෙවි ප්‍රවර්ධනයට ඔවුන් දිරිමත් කරන ලදි.
- පාරිභෝගිකයින්ට වඩා හොඳ තේරීමක් සලසා දෙමින් අපගේ නිෂ්පාදන පරාසය ද වැඩිදියුණු කරන ලදි.
- අලෙවිසැල් වල අලෙවි කටයුතු නිරීක්ෂණය කරන ලෙසටත්, ඒවා පිරිසිඳුව පවත්වා ගෙනයන ලෙසටත්, ක්ෂේත්‍ර කළමනාකරුවන්ට වගකීම පවරන ලදි.

## මත්පැන්

- අපගේ අලෙවිසැල් 14 ක මත්පැන් අලෙවි කෙරේ. ශ්‍රී ලංකා ඩිස්ටලරීස් සමාගම අපගේ ණය සීමාව රු. 500,000 සිට රු. 750,000 දක්වා ද 750,000 සිට රුපියල් මිලියනද දක්වා ද, පසුව එය රුපියල් මිලියන 1.5 දක්වාද වැඩි කළේය. අතීතයේ ගෙවීමට තිබූ ණය හේතුවෙන් එම සමාගම අපට දින 15 ට වැඩි ණය පහසුකම් ලබාදීමට එකඟ වූයේ නැත.

## පිරිවැටුම වැඩි කිරීම

- අපගේ අලෙවිසැල් සංඛ්‍යාව වැඩිකිරීම නිසා පිරිවැටුමද ඉහළ ගියේය. 2006 වසරේ වාර්ෂික පිරිවැටුම රු. මිලියන 560 කි. එය 2007 වසරේ දී රු. මිලියන 2.204 ක් විය.

## තොග පවත්වාගැනීමේ නව ඒකක හඳුන්වා දීම

- අප හඳුන්වාදුන් සියළුම නව භාණ්ඩ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවකින් අනුමත කෙරුණි. අළුතින් හඳුන්වා දුන් භාණ්ඩ ක්ෂේත්‍ර කළමනාකරුවන්ට පෙන්වනු ලැබූ අතර, ඔවුන්ගේ ඉල්ලීම මත පමණක් එම නව භාණ්ඩ අලෙවි සැල් වෙත යවන ලදි.

# අනාගත සංවර්ධනය සඳහා වන යෝජනා පිළිබඳ වර්තාව

## අලෙවිසැල්

- අලෙවිසැල් සංඛ්‍යාව වැඩි කිරීමට යෝජනා වූ අතර, බස්නාහිර පළාතේ වැඩිපුර අලෙවි සැල් විවෘත කිරීමට විශේෂ අවධානය යොමු විය.
- අළුතින් විවෘත කරන අලෙවිසැල්, සුපිරි වෙළෙඳ සංකීර්ණ ලෙස පෙනීයන පරිදි පවත්වා ගැනීම සඳහා ගොඩනැගිලි හිමිකරුවන් දැනුවත් කරමින් බිමට පිඟන් ගඩොල් ඇතිරීම. විශාල වීදුරු ආවරණ සවිකිරීම ආදී අවශ්‍ය නවීකරණ සිදු කිරීමට පියවර ගන්න ලදි.
- අපගේ අලෙවිසැල් වෙත තරුණ ප්‍රජාව සහ අළුත විවාහා වූ යුවලවල් ආකර්ශනය කර ගැනීමට ප්‍රධාන අරමුණ විය.
- තරුණ ප්‍රජාවේ චින්තන සංකල්ප වෙනස් කිරීම සඳහා ලංකා සතොස, කාගිල්ස් සමාගම මෙන් තත්ත්වයෙන් උසස් භාණ්ඩ සාධාරණ මිලට සපයන ආයතනයක් බව අවධාරණය කෙරේ.
- ෆොන්ටෙරා, යුනිලීවර් වැනි විශාල ප්‍රමාණයේ ආයතන වලින් සහාය ලබාගෙන අපගේ අලෙවිසැල් වල පෙනුම වැඩිදියුණු කිරීමට අවධානය යොමු කෙරේ. එහි දී අලෙවිසැල් ඇතුළත ආලෝකමත් කිරීම, ගොන්ඩෝලා භාණ්ඩ අසුරණ සවිකිරීම ආදිය සිදු කෙරේ.
- තවත් ප්‍රධාන අරමුණක් නම් ස්වයංක්‍රිය අලෙවි යන්ත්‍ර හඳුන්වා දෙමින් පාරිභෝගකයින්ට විස්තරාත්මකව බිල්පතක් ලබාදීමයි.

## 2. අලෙවිය

- අලෙවි ප්‍රවර්ධනය සඳහා කම්කරුවන් දිරිමත් කිරීමටත්, ඔවුන්ට අලෙවි පුහුණුව ලබාදීමටත් නාස්තිය වලක්වා ගැනීමටත් අවධාරණය යොමු කෙරෙනි. අපගේ අලෙවිසැල්වල ප්‍රවර්ධන කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීමට සැපයුම් කරුවන් සමඟ සාකච්ඡා කරන ලදි. අලෙවිසැල් සේවකයින් පිරිසිදු සහ පාරිභෝගික හිතකර පරිසරයක් ඇති කිරීමට කාර්යක්‍ෂම විය යුතුය.

## 3. මත්පැන්

- මත්පැන් අලෙවිය සහිත අලෙවිසැල් 14 ක සංඛ්‍යාව තව දුරටත් වැඩිකිරීමට ඇති හැකියාව සොයා බලන ලදි. එමගින් අපගේ සිල්ලර අලෙවිසැල් වලට වඩාත් හොඳ පෙනුමක් ලැබෙන අතර, අපගේ භාණ්ඩ පරාසය, වැඩි කිරීමටද හැකි වේ. එයින් සෑම මට්ටමකම පාරිභෝගිකයින් අප වෙළෙඳ සැල වෙත ආකාර්ශනය කර ගැනීමට හැකි වේ.

## 4. පිරිවැටුම වැඩි කිරීම

- අලෙවිසැල්වල පිරිවැටුම වැඩි කිරීම සඳහා ඉටුකර ගතහැකි මට්ටමේ ඉලක්ක තැබීමටත්, ඒවා ඉටු කරගැනීමේ වගකීම ක්‍ෂේත්‍ර කළමනාකරුවන්ට පැවරීමටත් තීරණය විය. එහිදී ඉක්මණින් අලෙවි වන භාණ්ඩ අඛණ්ඩව ප්‍රසම්පාදනය කරමින් අලෙවිසැල් වල අත්‍යාවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇති නොවීමට වග බලාගන්නා ලදි. භාණ්ඩ බෙදාහැරීම කාර්යක්‍ෂමව සිදුවන බවද තහවුරු කළ යුතුය.

## 5. අනවශ්‍ය වියදම් අවම කිරීම

- අතිකාල වෙනුවෙන් යන වියදම් පිළිබඳ අධීක්‍ෂණය කොට ඒවා අවම කිරීම.
- අලෙවිසැල්වල දුරකතන, විදුලි බලය හා ජලය භාවිතය අඩු කරගනිමින්, ඒවායේ වියදම සැලකිය යුතු ලෙස අඩු කරගැනීම.

# ලංකා සතොස සමාගමේ අනාගත දියුණුව සඳහා උපායමාර්ග

## මෙහෙයුම් උපායමාර්ග

- භාණ්ඩ පරාසය පුළුල් කිරීම.
- තොග ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමභාවය.
- පාඩුලබන අලෙවිසැල් යළි ස්ථානගත කිරීම.
- අලෙවිසැල් නවීකරණය හා සංවර්ධනය.
- තත්ත්වය හා පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම.
- වඩාත් පැතිරුණු සිල්ලර අලෙවි යාන්ත්‍රණයක් බවට පත් වෙමින්, වෙළෙඳපොල ඉඩ ප්‍රස්තාව වැඩිදියුණු කර ගැනීම.
- සැපයුම්කරුවන්, ප්‍රවාහනය, තොග ගබඩා සහ බෙදාහැරීම් මනාව සංවිධානය.
- පද්ධති හා ක්‍රමවේද නිසිපරිදි ක්‍රියාත්මක කිරීම.
- වැඩිපුර වෙළෙඳපොල අවශ්‍යතා වැඩිදියුණු කිරීම හා භාණ්ඩ පරාසය තව දුරටත් පුළුල් කිරීම.
- අපේම සන්නාම වෙළෙඳපොළට හඳුන්වා දීම.
- නව ව්‍යාපාරික ආදර්ශන භාවිතා කරමින් උපායමාර්ගකව සංවිධානය වීම.

**වී. විජේතිලක මිය**
අධ්‍යක්ෂ - මෙහෙයුම්

2008 ජූනි 24

# ලංකා සතොස සමාගමේ මූල්‍ය කාර්ය සාධන වාර්තාව

2007 දෙසැම්බර් වන විට ලංකා සතොස සමාගම රු. මිලියන 16 ක ලාභයක් වාර්තා කළේය. මෙය කෙටුම්පත් කළ ගිණුම් වලට අනුව 2006 වසරේදී ලැබූ රු. මිලියන 17 ක පාඩුව පියවා ගැනීමට ප්‍රමාණවත් තරම් විය. වසර 2006 දී රු. මිලියන 590 ක ආදායමක් අප වාර්තා කළ අතර. එය දෙගුණයකටත් වඩා වැඩි කරගනිමින් 2007 වසරේ දී රු. මිලියන 2,204 ක පිරිවැටුමක් ලබාගැනීමට හැකි විය. මෙය කුමන ප්‍රමිති මට්ටමකින් බැලුවද විශිෂ්ඨ ප්‍රගතියක් ලෙස සැලකිය හැකිය.

සියළුම සංඛ්‍යා 1000 ගණනයෙන් ඉදිරිපත් කර ඇත. "000"

| මාසය | 2006 | | 2007 | |
|---|---|---|---|---|
| | අලෙවිය | ලාභය / (පාඩුව) | අලෙවිය | ලාභය / (පාඩුව) |
| ජනවාරි | 3,809 | (1,483) | 102,364 | 833 |
| පෙබරවාරි | 10,674 | (1,580) | 100,641 | (2,049) |
| මාර්තු | 15,439 | (391) | 128,566 | (5,051) |
| අප්‍රේල් | 21,824 | (1,573) | 205,645 | 5,642 |
| මැයි | 17,182 | (2,527) | 100,513 | (1,785) |
| ජුනි | 27,145 | (1,774) | 152,553 | 1,291 |
| ජුලි | 46,092 | (1,079) | 186,057 | 2,092 |
| අගෝස්තු | 56,241 | (801) | 214,770 | 1,314 |
| සැප්තැම්බර් | 73,462 | (3,686) | 221,028 | 1,243 |
| ඔක්තෝම්බර් | 85,470 | (410) | 217,611 | 4,221 |
| නොවැම්බර් | 90,670 | (2,649) | 261,237 | 4,112 |
| දෙසැම්බර් | 142,574 | (334) | 313,361 | 4,996 |
| **එකතුව** | **590,582** | **(17,625)** | **2,204,346** | **16,859** |

2006 වසර ආරම්භයේදී ලංකා සතොස සමාගම සතුව පැවතියේ අලෙවිසැල් 05 ක් පමණි. එම වසර තුළ තවත් නව අලෙවිසැල් 45 ක් විවෘත කර දෙසැම්බර් 06 වන දින විට එම සංඛ්‍යාව 50 දක්වා වැඩිකර ගැනුණි. 2007 වසරේ දී තවත් අලෙවිසැල් 17 ක් විවෘත කළ අතර, 2008 වසරේදී තවත් අලෙවිසැල් 10 ක් විවෘත කරමින් මුළු සංඛ්‍යාව අලෙවිසැල් 78 ක් දක්වා වැඩිකෙරුණි.

එක් අලෙවි සැලක සාමාන්‍යය පිරිවැටුම 2006 වසරේදී මිලියන 2.8 සිට 2007 වසරේ දී මිලියන 4.8 දක්වා ඉහළ ගියේය. මෙය පෙරවසර හා සැසඳීමේදී 60% ක වර්ධනයකි.



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

අලෙවියෙන් දළ වශයෙන් 30% කට පමණ කොළඹ දිස්ත්‍රික්කයෙන් දායක වූ අතර, 15% ක දායකත්වයක් ලබාදෙමින් ගම්පහ දිස්ත්‍රික්කය දෙවන ස්ථානයට පත්විය. රත්නපුර, බදුල්ල, කළුතර හා පුත්තලම දිස්ත්‍රික්ක එකිනෙක 7% බැගින් දායක වී තිබේ. ඉහත සංඛ්‍යාවලින් පෙනී යන්නේ වැඩිම අලෙවියක් සඳහා පාදක වූයේ බස්නාහිර පළාත බවයි. එබැවින් එහි තව තවත් අලෙවිසැල් විවෘත කළ යුතු අතර, පවත්නා අලෙවිසැල් වල අලෙවිය තවත් වර්ධනය කළ යුතු වේ.

අලෙවිසැලක සාමාන්‍ය තොග ප්‍රමාණයේ වටිනාකම රු. මිලියන 2 සිට මිලියන 4 දක්වා වැඩි වී තිබේ. එහෙත් සාමාන්‍යයෙන් තොග පිරිවැටුම 82 සිට 27 දක්වා පහත බැස ඇත එය විශාල ජයග්‍රහණයකි.

නව අලෙවිසැල් විවෘත කරන විට අවම වශයෙන් සමාගමට රු. මිලියන 5 ක් වියදම් කිරීමට සිදු විය. එයින් මිලියන 4 ක් තොග සඳහා ද මිලියනයක් ප්‍රාග්ධන වියදම සඳහා ද වේ. 2007 වසරේදී රජයෙන් රු. මිලියන 64ක් අපට ලැබුණ අතර, එයින් නව අලෙවිසැල් 18 ක් විවෘත කෙරුණි. ඒ අනුව මුදල් ප්‍රවාහයේ මතුවන ප්‍රධාන බාධා මැඩපවත්වා ගැනීමට සමාගමට අමතර අරමුදල් යෙදවීමට සිදු විය. එබැවින් නව අලෙවිසැල් ස්ථාපිත කිරීමට රජයේ සහාය අවශ්‍ය බව නිර්දේශ කර තිබේ.

**මූල්‍ය කණ්ඩායම**

ලංකා සතොස සමාගම
2006 මැයි මස අග, 2007 මැයි, 2008 මැයි වන විට දළ පිරිවැටුම
(මාස 05 ක කාලසීමාවක් සඳහා)






ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

ලංකා සතොස සමාගම
2006 මැයි මස අග, 2007 මැයි, 2008 මැයි වන විට
එක් අලෙවිසැලක සාමාන්‍ය අලෙවිය



## 2006 මැයි මස අග, 2007 මැයි, 2008 මැයි වන විට සැම සේවකයෙකුම සඳහා සාමාන්‍ය අලෙවිය (මාස 05 ක කාලසීමවක් සඳහා)



ලංකා සතොස සමාගම
2006 මැයි මස අග, 2007 මැයි, 2008 මැයි වන විට සේවක සංඛ්‍යාව



**ලංකා සතොස සමාගම**
**2006 මැයි මස අග, 2007 මැයි, 2008 මැයි වන විට**
**පවතින අලෙවිසැල් සංසන්ධනය**



# සීමාසහිත ලංකා සතොස

## විගණන කරුවන්ගේ වාර්තාව

### සීමා සහිත ලංකා සතොස සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් වෙත

2006 මාර්තු මස 31 වන දිනට ලංකා සතොස සමාගමේ ශේෂපත්‍රය අප විසින් විගණනයට ලක්කොට ඇත. ඒ හා ආශ්‍රිත අදාල කාලසීමාව සඳහා වන ආදායම් ප්‍රකාශ ගිණුම් ප්‍රතිපත්ති සටහන් 01 සිට 14 දක්වා සඳහන් කොට තිබේ.

### අධ්‍යක්‍ෂ වරුන්ගේ හා විගණන කරුවන්ගේ අදාල වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මෙම මුදල් ප්‍රකාශ සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්‍ෂවරුන් වෙත පැවරී ඇත. අපේ වගකීම වී ඇත්තේ අප සිදුකල විගණනයට අනුව මෙම මුදල් ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමයි.

### නිගමන පදනම

අපේ විගණන ක්‍රියාවලිය සිදුකරනු ලැබුවේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය. එහිදී අදාළ මුදල් ප්‍රකාශ ද්‍රව්‍යමය අවප්‍රකාශවලින් තොර බවට සාධාරණ සහතිකයක් ලබාගැනීම සඳහා සැළසුම් කොට ක්‍රියාත්මක විය යුතුව තිබේ. විගණනයක දී පරීක්‍ෂා කිරීමේ පදනම මත විමර්ශනය කිරීම අදාල මුදල් ප්‍රකාශවල සඳහන් ගණන් මිණුම් තහවුරු කෙරෙන සාක්ෂි, භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති තක්සේරු කිරීම හා අධ්‍යක්‍ෂවරුන් විසින් ඉදිරිපත් කර ඇති සැලකිය යුතු ඇස්තමේන්තු ඇගයීමට ලක්කොට එම මුදල් ප්‍රකාශ පිළිබඳ සමස්ත ඉදිරිපත් කිරීමක් සිදුකිරීම ද අයත් වේ. එසේම අදාල මුදල් ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකර ඇතිදයන්න ද තහවුරු කළ යුතුය.

අපගේ විගණන කර්තව්‍යට අවශ්‍යවන සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් අපගේ අපරිම දැනුමට හා විශ්වාසය තහවුරුවන පරිදි ලබාගත්බව සහතික කරමු.

### නිගමනය

මෙම සමාගම සඳහා විගණනකරුවන් ලෙස මූලික වශයෙන් කටයුතු බාරගැනීමේ කාල සීමාවට පෙර, එනම් 2006 මාර්තු 31 දිනට වන ද්‍රව්‍ය භාණ්ඩ ලයිස්තු ගණනය කිරීම් අප නිරීක්‍ෂණය කර නොමැත. සමාගමේ වාර්තාවල ස්වභාවය අනුව භාණ්ඩ ලයිස්තු ප්‍රමාණවල අදාළ වෙනත් විගණන ක්‍රමවේද අනුව ඒ පිළිබඳ අපට සෑහීමට පත්විය නොහැක.

එවැනි ගැලපීම්වල ප්‍රතිඵල සඳහා හැර අපේ නිගමනය නම් කිසියම් තහවුරු කිරීමක් සිදුකරනු ලැබීමට සමාගම, 2006 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලසීමා සඳහා නිසිපරිදි ගිණුම් පොත් නඩත්තුකර තිබුණේනම් අපට සෑහීමකට පත්වීමට හැකියාව තිබුණි. අපගේ උපරිම දැනුම පරිදි සහ අපට ලබාදී ඇති පැහැදිලි කිරීම් අනුව ඉහත කී ශේෂපත්‍රය සහ අදාළ ආදායම් ප්‍රකාශ, මුදල් ප්‍රවාහ සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 01 සිට 14 දක්වා වන සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කොට ඉදිරිපත්කර තිබේ. එහෙත් ගිණුම් පිළිබඳ අංක 01 සටහනේ තොරතුරු 1982 අංක 17 දරණ සමාගම් ආඥා පනතේ විදිවිධානවලට අනුකූලව විය යුතුය. එයින් 2006 මාර්තු 31 දින දක්වා වන කටයුතු, ලාභය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ඉදිරිපත් විය යුතුය.

### සමාගම සමඟ ගිවිසුම් සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩලයේ අභිරුචිය

අප හට ලැබී ඇති තොරතුරුවලට අනුව සමාගමේ අධ්‍යක්‍ෂකවරුන් මුදල් ප්‍රකාශවල සටහන් අංක 11 සඳහන් කළ අවස්ථාවලදී හැර 2006 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ කාලසීමාව තුළ සමාගමේ කොන්ත්‍රාත් කෙරෙහි සෘජුව හො වක්‍රව අභිරුචියක් දක්වා නොමැත.

HLB Edirisinghe & Co

**එච්. එල්. බී. එදිරිසිංහ සහ සමාගම**
**වරලත් ගණකාධිකාරීවරු**
**කොළඹ**

2007 නොවැම්බර් 23

## සීමාසහිත ලංකා සතොස සමාගම

## 2006 මාර්තු 31 දිනට ශේෂපත්‍රය

| **යෙදවූ වත්කම්** | **සටහන** | **රු. ශත** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල යන්ත්‍රාගාර හා උපකරණ | 02 | 556,970.00 |
| බැංකු ආරක්ෂණ | 03 | 10,500,000.00 |
| | | 11,056,970.00 |
| **ජංගම වත්කම්** | | |
| භාණ්ඩ ලැයිස්තු | | 34,854,017.00 |
| සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව | 04 | 5,923,141.78 |
| පාලන ගිණුම් | | 230,974.54 |
| ESC | 05 | 157,565.00 |
| මුදල් සහ බැංකු ගිණුම් | | 1,940,764.34 |
| | | 43,106,462.66 |
| යෙදවූ මුළු වත්කම් | | 54,163,432.66 |
| **සමකොටස් සහ වගකීම්** | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | |
| කොටස් ප්‍රාග්ධනය | 06 | 70.00 |
| රඳවාගත් ඉපැයීම් / (අලාභය) | | (3,908,306.51) |
| රජයේ අරමුදල | | 46,189,321.00 |
| | | 42,281,014.49 |
| මුළු ප්‍රාග්ධනය හා සංචිත | | 42,281,084.49 |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ණය හිමියෝ | 07 | 9,227,857.53 |
| සමුච්චිත වියදම් | 08 | 2,654,490.64 |
| | | 11,882,348.17 |
| **මුළු කොටස් හා වගකීම්** | | 54,163,432.66 |

මෙම මුදල් ප්‍රකාශ සකස්කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා වන සටහන් මුදල් ප්‍රකාශවල අත්‍යන්ත කොටසකි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

.............................. **අධ්‍යක්ෂ**

.............................. **අධ්‍යක්ෂ**

23 නොවැම්බර් 2007

## සීමාසහිත ලංකා සතොස සමාගම

### 2006 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා

### ආදායම් ප්‍රකාශය

| | සටහන | 2005 / 06<br>රු. ශත |
|---|---|---|
| ආදයම | 09 | 30,802,959.77 |
| අලෙවි වියදම | | (25,412,486.14) |
| දළ ලාභය | | 5,390,473.63 |
| වෙනත් ආදායම් | 10 | 31,026.40 |
| | | 5,421,500.03 |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | | (164,762.90) |
| පරිපාලන වියදම් | | (8,860,734.09) |
| මූල්‍ය සහ වෙනත් වියදම් | | (304,309.55) |
| | | (9,329,806.54) |
| බදුවලට පෙර ලාභය / (අලාභය) | | (3,908,306.51) |
| බදුකරණය | | 00.00 |
| බදුවලට පසු ලාභය / (අලාභය) | | (3,908,306.51) |

23 නොවැම්බර් 2007

## සීමාසහිත ලංකා සතොස සමාගම

**2006 මාර්තු 31 දිනෙන් අවසන් වූ**

| **කාලසීමාව සඳහා ආදායම් ප්‍රකාශය** | **2005/06** |
|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකරකම්වල මුදල් ප්‍රවාහ** | **රු. ශත** |
| බදු වලට පෙර ලාභය / (ආලාභය) | (3,908,306.51) |
| ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය) | (3,908,306.51) |
| භාණ්ඩ ලැයිස්තු වෙනස්කම් | (34,854,017.00) |
| බැංකු ආරක්ෂණ වෙනස්කම් | (10,500,000.00) |
| සතොස ගිණුම්වල වෙනස්කම් | (5,923,141.78) |
| පාලන ගිණුම්වල වෙනස්කම් | (230,974.54) |
| වෙළෙඳ ණය හිමියන්ගේ වෙනස්කම් | 9,227,857.53 |
| සමුච්ත වියදම්වල වෙනස්කම් | 2,654,490.64 |
| ESC වෙනස්කම් | (157,565.00) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලදී භාවිතා කළ මුදල් | (39,783,350.15) |
| ගෙවූ සුළු බදු | 0.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුළු මුදල් ප්‍රවාහය | (39,783,350.15) |
| **ආයෝජන ක්‍රියාකාකම්වල මුදල් ප්‍රවාහය** | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම් | (556,970.00) |
| ආයෝජන ක්‍රියාකාරකම්වල මුළු මුදල් ප්‍රවාහය | (556,970.00) |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහය** | |
| ලැබූ රජයේ අරමුදල් | 46,169,321.00 |
| කොටස් නිකුතුව | 0.00 |
| මුදල් කටයුතුවලින් එන මුළු ලැබීම් | 46,189,321.00 |
| මුදල් හා මුදල් සමානදේ වල මුළු වැඩිවීම | 1,940,694.34 |
| කාල සීමාව ආරම්භයේ මුදල් සහ මුදල් සමානදේ | 0.00 |
| කාලසීමාව අවාසනයේදී මුදල් සහ මුදල් සමානදේ සටහන - A | 1,940,764.34 |
| **සටහන - A කාලසීමාව අවාසනයේදී මුදල් සහ මුදල් සමානදේ** | |
| මහජන බැංකුව | 1,314,833.69 |
| සුළු අත්මුදල් අත්තිකාරම් | 32,683.35 |
| පාවෙන මුදල් | 81,500.00 |
| අතැති මුදල් | 511,747.30 |
| | 1,940,764.34 |

23 නොවැම්බර් 2007

## සීමාසහිත ලංකා සතොස සමාගම

## 2006 මාර්තු 31 දිනෙන් අවසන් කාලසීමාව සඳහා සමකොටස් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

| | රඳවාගත් ඉපැයීම් (අලාභය) | අරමුදල් ගිණුම | මුළු ගණන |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| **2005 අප්‍රේල් 01 දිනට ශේෂය** | 0.00 | 0.00 | 0.00 |
| ලැබූ අරමුදල් | 0.00 | 46,189,321.00 | 46,189,321.00 |
| කාලසීමාව සඳහා ලාභය / (අලාභය) | (3,908,306.51) | 0.00 | (3,908,306.51) |
| 2006 මාර්තු 31 වන දිනට ශේෂය | (3,908,306.51) | 46,189,321.00 | 42,281,014.49 |

23 නොවැම්බර් 2007

**සීමාසහිත ලංකා සතොස සමාගම**

**2006 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්වල සටහන්**

## සටහන - 01 ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සංස්ථාපිත තොරතුරු

#### 1.1.1 පොදු

සීමාසහිත ලංකා සතොස සීමිත බැරකම් සහිත ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමකි.

එහි ප්‍රධාන කාර්යාලය කොළඹ 01 යෝක් වීදිය අංක 108 දරණ ස්ථානයේ පිහිටා තිබේ.

#### 1.1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

අදාළ කාල සීමාව තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ පාරිභෝගික භාණ්ඩ තොග හා සිල්ලර වෙළඳාමයි.

#### 1.1.3 සේවක සංඛ්‍යාව

අදාළ කාලසීමාව අවසානයේ සේවක සංඛ්‍යාව 126 ක් විය.

### 1.2 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

#### 1.2.1 සකස්කිරීමේ පදනම

2006. 03. 31 දිනට අවසන් වූ කාලසීමාව තුළ සමාගමේ ශේෂපත්‍රය, ආදායම් ප්‍රකාශය, සමකොටස් වෙනස් වීම් සහ මුදල් ප්‍රවාහ සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සටහන් සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවය. මෙම මුදල් ප්‍රකාශ ඓතිහාසික වැය පදනම යටතේ සකස්කොට ශ්‍රී ලංකා රුපියල් වලින් සකස්කොට තිබේ.

#### 1.2.2 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සකස් වී ඇත්තේ මුදල් ප්‍රකාශවල වාර්තා වී ඇති මූලික ආදයම හා වියදම පදනම් කරගෙනය. එය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව ගණනය කර තිබේ.

#### 1.2.3 භාණ්ඩ ලැයිස්තු

සෙමෙන් අලෙවි වන අභාවිත භාණ්ඩ කෙරෙහි ඉඩහරිමින් අවම වැය හා සාක්ෂාත් කරගත හැකි ශුද්ධ අගය මත භාණ්ඩ ලේඛන තක්සේරු කර ඇත.

**සීමාසහිත ලංකා සතොස සමාගම**

**2006 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්වල සටහන්**

## සටහන 01 - ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි

### 1.2.4 වෙළඳ හා වෙනත් ලැබීම්

වෙළඳ හා වෙනත් ලැබීම් ප්‍රකාශිතව ඇත්තේ අයෝග්‍ය හා සැකසහිත ලැබීම් සඳහා සාක්ෂාත් කර ගත හැකි ප්‍රතිපාදන තක්සේරු කරගැනීමෙන් පසුවය.

### 1.2.5 මුදල් හා මුදල් සමාන දේ

මුදල් හා මුදල් සමාන දේ ලෙස අර්ථදැක්වෙන්නේ අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පත් හා කෙටිකාලීන දැඩි ද්‍රවශීල ආයෝජන, පහසුවෙන් මාරුකල හැකි බවට හඳුනාගත් මුදල් හා අගය වෙනස්වීමේ අවදානමට ඉතා සුලුවෙන් ලක්වූ මුදල්ය.

### 1.2.6 දේපල යන්ත්‍රාගාර උපකරණ

දේපල යන්ත්‍රාගාර හා උපකරණ සඳහන් කර ඇත්තේ ඓතිහාසික වැය රහිත සමුච්චිත ක්ෂයවීම් හා අගය අඩුවීම් සැළකිල්ලට ගනිමිනි. ක්ෂයවීම් ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ ඇස්තමේන්තු ගත භාවිතාකළ හැකි කාලසීමාව හා පහත දැක්වෙන වාර්ෂික ක්ෂයවීම් ප්‍රතිශතයන් සැලකිල්ලට ගෙන සරල රේඛීය ක්ෂයවීම් පදනම යටතේය.

භාවිතාකළ ප්‍රධාන වාර්ෂික ක්ෂයවීම් අනුපාතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| පරිගනක උපකරණ | 25% |
| කාර්යාල උපකරණ | 20% |
| පරිගනක මෘදුකාංග | 25% |
| සන්නිවේදන උපකරණ | 20% |

### 1.2.7 බැරකම් සහ ප්‍රතිපාදන

#### (අ) නිශ්චිත දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදලේ (EPF) හා සේවක භාරකාර අරමුදලේ (ETF) අදාල අනපණත් හා රෙගුලාසි වලට අනුකූලව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල දායකත්වයට සුදුසුකම් ලබා සිටිති. සමාගම සේවකයින්ගේ දළ වැටුප මෙන් සියයට 12 කින් සේවක අර්ථසාධක අරමුදල සඳහා ද සියයට 3 කින් සේවක භාරකාර අරමුදල සඳහාද දායක වෙයි.

## සීමාසහිත ලංකා සතොස සමාගම

## 2006 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්වල සටහන්

## සටහන 01 - ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි

### 1.2.8 ආදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගනු ලබන්නේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාව්‍යතාව අනුවය. ආදායම් හා දරණ ආශ්‍රිත වියදම් විශ්වාසනීය ලෙස ගණනය කළ හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබිය හැකි මුළු වෙළඳ වට්ටම් හා අලෙවි බදු වල සාධාරණ අගය සැලකිල්ලට ගැනීමෙනි.

**(අ) ගොන්ඩෝලා ආදායම**

භාණ්ඩ අලෙවියෙන් ආදායම හඳුනාගනු ලබන්නේ භාණ්ඩවල සැලකිය යුතු අවදානම හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත පැවරීමෙන් පසුවය. එහිදී සමාගම භාණ්ඩයේ පරිපාලනය අයිතිය හෝ භාණ්ඩ පාලනය පිළිබඳ කිසිදු ප්‍රමාණයකින් වගකීමක් රඳවා නොගන්නා තත්ත්වයක පසුවේ.

**(ආ) ගොන්ඩෝලා ආදායම**

ගොන්ඩෝලා ආදායම හඳුනාගනු ලබන්නේ උපචය වන පදනම මතය.

**(ඇ) කුලී ආදායම**

කුලී ආදායම හඳුනාගනු ලබන්නේ උපචය වන පදනම මතය.

**(ඈ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ සත්‍ය පදනම මතය.

### 1.2.9 වියදම් හඳුනාගැනීම

(අ) ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරණ ලද වැය හා විශේෂිත ආදායම් අයිතම, ලද ඉපැයීම් අතර ඍජු සම්බන්ධතා පදනම යටතේය. ව්‍යාපාර පවත්වාගෙන යාමේදී හා දේපල, යන්ත්‍රාගාර හා උපකරණ කාර්යක්ෂම ලෙස නඩත්තු කිරීමේදී දරණ ලද සියලු වියදම් වසරේ ලාභය සඳහා හේතුවූ ආදායමක් බවට හරවා තිබේ.

## සීමාසහිත ලංකා සතොස සමාගම

## 2006 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්වල සටහන්

### සටහන 02 - දේපළ යන්ත්‍රාගාර හා උපකරණ

| | 2005.04.01. දිනට | එකතුකිරීම් | ඉවත්කිරීම් | 2006.03.31 දිනට |
|---|---|---|---|---|
| **වැය** | **රු.ශත** | **රු.ශත** | **රු.ශත** | **රු.ශත** |
| පරිගනක උපකරණ | 0.00 | 178,580.00 | 0.00 | 178,580.00 |
| කාර්යාල උපකරණ | 0.00 | 231,500.00 | 0.00 | 231,500.00 |
| පරිගනක මෘදුකාංග | 0.00 | 48,500.00 | 0.00 | 48,500.00 |
| සන්නිවේදන උපකරණ | 0.00 | 98,390.00 | 0.00 | 98,390.00 |
| | 0.00 | 556,970.00 | 0.00 | 556,970.00 |
| **ක්ෂයවීම්** | | | | |
| පරිගනක උපකරණ | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| කාර්යාල උපකරණ | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| පරිගනක මෘදුකාංග | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| සන්නිවේදන උපකරණ | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පොතෙන් කපාහරින ලද අගය** | | | | |
| පරිගනක උපකරණ | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| කාර්යාල උපකරණ | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| පරිගනක මෘදුකාංග | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| සන්නිවේදන උපකරණ | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **සමස්ත පොත් අගය** | 0.00 | | | 556,970.000 |

## සීමාසහිත ලංකා සතොස සමාගම

## 2006 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්වල සටහන්

**2006. 03. 31**

### සටහන 03 - බැංකු ආරක්ෂණ

| | රු.ශත |
|---|---|
| සීමාසහිත යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම | 2,000,000.00 |
| ඊස්ට් වෙස්ට් සමාගම | 2,000,000.00 |
| සීමාසහිත ෆොන්ටෙරා බ්‍රෑන්ඩ්ස් ලංක පුද්ගලික සමාගම | 2,000,000.00 |
| සීමාසහිත කීල්ස් ආහාර නිෂ්පාදන සමාගම | 1,000,000.00 |
| මැලිබන් බිස්කට් සමාගම | 1,500,000.00 |
| මැලිබන් කිරි නිෂ්පාදන සමාගම | 500,000.00 |
| මන්චි බිස්කට් සමාගම | 500,000.00 |
| ලංකා කැනරීස් සමාගම | 500,000.00 |
| හේමාස් මාර්කටින් පුද්ගලික සමාගම | 500,000.00 |
| | 10,500,000.00 |

### සටහන 04 - පාලන ගිණුම්

| | රු.ශත |
|---|---|
| බැර මැම පාලනය | 19,330.00 |
| චෙක් පාලනය | 8,400.00 |
| කාඩ්පත් පාලනය | 203,244.54 |
| | 230,974.54 |

### සටහන 05 - මුදල් සහ බැංකු ගිණුම්

| | රු.ශත |
|---|---|
| මහජන බැංකුව | 1,314,833.69 |
| සුළු අත් මුදල් අත්තිකාරම් | 32,683.35 |
| පාවෙන මුදල් | 81,500.00 |
| අතැති මුදල් | 511,747.30 |
| | 1,940,764.34 |

### සටහන 06 - කොටස් ප්‍රාග්ධනය

| | රු.ශත |
|---|---|
| **බලයලත්** | |
| කොටසක් රු. 10 බැගින් වන කොටස් 20,000,000 ක් | 200,000,000.00 |
| **නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවන ලද** | |
| රු. 10 බැගින් වන සාමාන්‍ය කොටස් 07 | 70.00 |

### සටහන 07 - වෙළෙඳ ණය හිමියෝ

| | රු.ශත |
|---|---|
| වෙළෙඳ ණය හිමියෝ | 9,217,857.53 |
| ගොන්ඩෝලා ආදායම් පූර්ව ගෙවීම් | 10,000.00 |
| | 9,227,857.53 |

**සීමාසහිත ලංකා සතොස සමාගම**

**2006 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන**

**ගිණුම්වල සටහන්** **2006. 03. 31**

## සටහන 08 - උපචය වූ වියදම්

| | රු.ශත |
|---|---|
| EPF | 401,918.00 |
| ETF | 54,807.00 |
| උ.ගෙ.වි | 15,651.00 |
| ESC | 157,565.00 |
| විගණක ගාස්තු හා වියදම් | 0.00 |
| බදු ගාස්තු හා වියදම් | 0.00 |
| කුලිය | 1,074,474.43 |
| සන්නිවේදන උපකරණ | 10,630.00 |
| පරිගණක මෘදුකාංග | 10,000.00 |
| ජලය | 15,704.47 |
| විදුලිය | 503,233.27 |
| දුරකතන | 95,377.47 |
| පිරිවැටුම් බදු | 315,130.00 |
| | 2,654,490.64 |

## සටහන 09 - ආදායම් ප්‍රකාශය

| | රු.ශත |
|---|---|
| **මෙහෙයුම් ලාභා / (අලාභය) පහත පරිදි ලැබේ** | |
| ආදායම | 31,114,100.77 |
| පිරිවැටුම් බද්ද | (311,141.00) |
| | 30,802,959.77 |
| **වියදම** | |
| අලෙවි වියදම | (25,412,486.14) |
| වැටුප් | (4,382,149.96) |
| විගණන ගාස්තු හා වියදම් | 0.00 |
| බදු ගාස්තු හා වියදම් | 0.00 |
| වෙනත් | (4,643,347.03) |
| | (34,437,983.13) |
| **මූල්‍ය වියදම්** | |
| හර බදු | (37,529.74) |
| චෙක්පොත් ගාස්තු | (3,600.00) |
| බැංකු ගාස්තු | (260,075.81) |
| වෙනත් වියදම් | (3,104.00) |
| | (304,309.55) |

**සීමාසහිත ලංකා සතොස සමාගම**

**2006 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන**
**ගිණුම්වල සටහන්** **2006. 03. 31**

## සටහන 10 - වෙනත් ආදායම්

| | රු.ශත |
|---|---|
| විවිධ ආදායම් | 3,526.40 |
| Shop'N Shop කුලිය | 22,500.00 |
| ගොන්ඩෝ ආදායම | 5,000.00 |
| | 31,026.40 |

## සටහන 11 - අධ්‍යක්ෂකවරුන්ගේ අභිරුචිය

සමාගමේ කිසිම අධ්‍යක්ෂකවරයෙක් එහි පවත්නා හා යෝජිත කොන්ත්‍රාත් සඳහා ඍජුව හෝ වක්‍රව අභිරුචියක් දක්වනු නොලැබේ.

## සටහන 12 - ශේෂපත්‍ර දිනයෙන් පසුව සිදුවන අවස්ථා

ශේෂපත්‍ර දිනයට පසුව ගිණුම්වල අනාවරණ කල යුතු හෝ ගැලපීම් කල යුතු කිසිදු සිද්ධියක් උද්ගතවී නැත.

## සටහන 13 - ප්‍රාග්ධන බැඳීම්

2006. 03. 31 දින කිසිදු ප්‍රාග්ධන බැඳීමක් වාර්තා වී නැත.

## සටහන 14 - අවිනිශ්චිත අවස්ථා

2006. 03. 31 දිනට කිසිදු අවිනිශ්චිත සිදුවීමක් වාර්තා වී නැත.



## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ පණිවිඩය

සීමා සහිත ලංකා සතොස සමාගම වසර 2005 දී සංස්ථාපිත කරන ලද රජය මත පාදක වූ සමාගමකි. එහි 2005 / 2006 වසර සඳහා පළමු වාර්ෂික මහ සභා රැස්වීම 2008 ජූනි මස 24 වන දින පවත්වනු ලැබීය.

මාගේ පත්වීම 2008 පෙබරවාරි මස අග භාගයේ සිට ආරම්භ වුවත් අධ්‍යක්ෂක මණ්ඩල ලේකම් ලෙස මාගේ නිරීක්ෂණ මෙහිදී ඉදිරිපත් කරමි. රැස්වීම් කිහිපයකට පසුව අප හට පෙනී ගියේ සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් මා හට ලබාදුන් දර්ශක අනුව පළමු වාර්ෂික මහ සභා රැස්වීම ප්‍රමාද වී හෝ පැවැත්වීම අත්‍යාවශ්‍ය බවයි. එසේම ඒ ඒ අංශවල ප්‍රධානීන් ද ඇගයුම් රැස්වීම් පැවැත්වීම අත්‍යාවශ්‍ය බව මා හට පෙනී ගොස් තිබේ.

සාමාන්‍ය අදහස නම් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ වගකීම වාර්තා සම්බන්ධීකරණය අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තා කිරීම සහ සමාගම් පනත යටතේ ඇති රාජකාරි සම්පූර්ණ කිරීමයි. රාජකාරි ඉටුකරගෙන යාමේදී අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සමාගමේ වඩාත් හිතකර වාතාවර්ණයක් පවත්වා ගනිමින් සාර්ථකත්වය කරා පියනැඟීම සඳහා සමාගම හා සමාගමේ ලේකම්වරු, අධ්‍යක්ෂක මණ්ඩලය සහ කළමනාකරණ කණ්ඩායම් අතර සම්බන්ධතා පවත්වාගැනීම ඉතා වැදගත් කරුණකි. වෙනත් වචනවලින් කිවහොත් සියළුම කටයුතු අධීක්ෂණය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වඩාත් සුමට වටපිටවක් ඇති කිරීමට ක්‍රියා කළ යුතු වේ.

මා මෙම ආයතනයට එක් වී ඇත්තේ මාගේ වගකීම් හොඳහැටි දැනගනිමින් නෛතික හා පරිපාලන වශයෙන් මා සතු දීර්ඝ කාලීන පලපුරුද්ද අනුව ක්‍රියාත්මක වෙමින් අර්ධ රාජ්‍ය ආයතනයක ලේඛනමය කටයුතු සාර්ථකව සිදු කිරීමටයි. එහිදී අලෙවි විකුණුම් හා නිෂ්පාදන අංශවල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මා හට වගකිවයුතු කාර්යභාරයක් මෙම ආයතනය තුළ ඉටු කිරීමට සිදු වී තිබේ.

කැපවීමෙන් සහ උද්යෝගයෙන් මෙම සේවා පාදක ආයතනය තුළ මාගේ වගකීම් ඉටු කිරීමට හැකි බව මා දැඩිව විශ්වාස කරමි. අත්‍යාවශ්‍ය භාණ්ඩ සාධාරණ මිළට ඉතාම සුදුසු අවස්ථාවේ දී ජනතාව වෙත සැපයීම සඳමා මෙම ආයතනය සතු කාර්ය භාරය ඉතා හොඳින් පවත්වාගෙන යාමට මම අපේක්ෂා කරමි.

සභාපති අධ්‍යක්ෂක මණ්ඩලය, අංශ ප්‍රධානීන් හා සමස්ත කාර්යා මණ්ඩලය වාර්ෂික මහ සභා රැස්වීම් වාර්ථාව හා ආයතන ප්‍රධානීන්ගේ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා මා හට ලබාදුන් සහාය පිළිබඳ මම උදක්ම ස්තූතිවන්ත වෙමි.

කළමනාකරණ කණ්ඩායම සමග ඇගයුම් රැස්වීම සංවිධානය කිරීමට දැක්වූ සහයෝගය පිළිබඳවද මගේ ස්තූතිය පිරිනමමි.

සුභ පැතුම් !

නීතිඥ සීතා විජේවර්ධන මිය

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

2008 ජූනි 23



ලංකා සතොස

අභිමානයෙන් ඉදිරියට

GRACEFULLY FORWARD

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report

## 2005 / 2006




**LANKA SATHOSA LIMITED**

No. 108, 1st Floor, Negris Building,
York Street, Colombo 01.

General Phone No. : 2436301 - 2
Fax : 2437583